

# 18 – පාඩම

# පොත පතෙන් සරු දහම්

# 9 – ශ්‍රේණිය

# සිංහල භාෂාව

# 18 - පාඩම , පොත පතෙන් සරු දහම්

නිපුණතාව :- 9 .0 සංස්කෘතිය හ සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි .

නිපුණතා මට්ටම :- 9 .2 පොතපත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි .

# ක්‍රියාකාරකම් - 1

❖ පහත එක් එක් වාක්‍යයේ හිස්තැන් සම්පූර්ණ කිරීමට සුදුසු පදය තෝරන්න .

1 . තිරුක්කුරල් නැමති මානව ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථයේ රචකයා වන්නේ ........................ නැමැත්තා ය .

i .ගුරුළුගෝමි ii . තිරුවල්ලුවර් iii . අලගියවන්න මුකවෙට්ටි iv. සිල්වා ගුරු මුහන්දිරම්

2 . පූතිගත්ත තිස්ස තෙරුණ්ගේ කතාව ඇතුළත් වන්නේ ................................. ධර්ම ග්‍රන්ථයෙහිය .

i . සද්ධර්මරත්නාවලි ii . සද්ධර්මාලංකාර iii .පන්සිය පනස් ජාතක iv . අමාවතුර

3 . “ ලෝවැඩසඟරාව ” කාව්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ .............................. යුගයේදී ය .

i . කුරුණෑගල ii . දඹදෙණි iii . කෝට්ටේ iv . ගම්පල

4 . .............................. ලෝකෝපකාරය කාව්‍ය ග්‍රන්ථයේ රචකයා වේ .

i . වීදාගම මෛත්‍රීය හිමි ii . රණස්ගල්ලේ හිමි iii .අලගියවන්න මුකවෙට්ටි තුමා iv . තිරුවල්ලුවර්

5 . මේ අතරෙන් උපදේශ කාව්‍ය ග්‍රන්ථයක් නොවන්නේ ..............................

i . සිරිත් මල්දම ii . සුභාෂිතය iii . ලෝකෝපකාරය iv . සැලළිහිණි සන්දේශය

6 . ප්‍රිය වචන කතා කිරීමේ බලවත්කම ..............................කතාවෙන් ප්‍රකාශ වේ .

i . මාතුපෝෂක ජාතක ii . නන්දිවිසාල ජාතක iii . පූතිගත්ත තිස්ස තෙරුණ්ගේ iv . චුල්ල හංස ජාතක

7 . කුරුණෑගල යුගයේ .......................... රචනා කෙරිණි .

i .සැලළිහිණි සන්දේශය ii . අමාවතුර iii . පන්සිය පනස් ජාතක පොත iv .ලෝකෝපකාර

8 . සීතාවක යුගයේ රචිත උපදේශ කාව්‍ය ග්‍රන්ථය වන්නේ......................... යයි .

i . සිරිත් මල්දම ii . ලෝකෝපකාරය iii . ලෝවැඩසඟරාව iv සුභාෂිතය


ලෝවැඩ
සඟරාව
LO VADA SANGARAWA




සුභාෂිතය


භාව සහිත
සිරිත් මල්දම


රණස්ගල්ලේ හිමි විසින් රචිත
ලෝකෝපකාරය


සුභාෂිතය
ඉතා සරල සිංහල තේරුම් සහිතයි
සිදේවි ප්‍රකාශනයක්

# ක්‍රියාකාරකම් - 2

- **පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න.**

1 . සමාජයේ සාමූහික එකඟතාව සාරධර්මයේ පදනමයි .

2 . ජාති ආගම් අනුව විශේෂ වූ චර්යා සිරිත් විරිත් නැත .

3 . “පෙරියපුරාණම් ”දෙමළ උපදේශ කාව්‍ය ග්‍රන්ථයකි .

4 . පරාක්‍රම කොඩිතුවක්කුගේ කාව්‍ය නිර්මාණයකි “පොඩි මල්ලියේ ”.

5 . “ පංචතන්ත්‍රය” දෙමළ උපදේශ කාව්‍ය ග්‍රන්ථයකි .

6 . “ හුණුවටයේ නාට්‍ය ” හෙන්ඩ්‍රි ජයසේන මහතාගේ නිෂ්පාදනයනයකි.

7 . “බයිබලය ” ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථයකි .

8 . සැලළිහිණි සන්දේශයේ රචකයා රණස්ගල්ලේ හිමියන්ය .

9 . සමාජයට යහපත සලසන ආකාරය ශුද්ධ වූ කුරානයේ ද සඳහන් ඇත .

10 . හිතෝපදේශය සංස්කෘත උපදේශ කාව්‍ය ග්‍රන්ථයකි .

| |
|---|
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |

# ක්‍රියාකාරකම් - 3

- **පහත සඳහන් වාක්‍යවල හිස් තැනට ගැළපෙන නිර්මාණය රචුම තුළින් තෝරා ලියන්න .**

1 . සියලු මනුෂ්‍යයන් දේව දරුවන් වන නිසා සියල්ලෝම සහෝදරයන් යන්න ………………….සඳහන් වේ .

2 . ඇතෙකුගේ තම අඳ දෙමව්පියන් රැකගත් අයුරු ………………………….. තුළින් ප්‍රකාශ වේ .

3 . ප්‍රිය වචන කතා කිරීම සුබ නිමිත්තක් බව ………………………….. තුළින් පැහැදිලි වේ .

4 . ජාති භේද නොසලකා උවටැන් කිරීම උතුම් ක්‍රියාවක් බව …………………… කතාවෙන් පැහැදිලි වේ .

5 . හංස සේනාධිපති හංස රාජයාට උපකාර කළ ආකාරය …………………………..කතාවේ සඳහන් වේ .

6 . ජාති භේද ඉවත ලා ලෝකය යහපත් තැනක් කරන්නට ආරාධනා කිරීම ……………………….. තුළින් ප්‍රකාශ වේ .

7 . ගැමියාගේ සුහදකමේ සුවඳ ගැන …………………… කවියෙන් ප්‍රකාශ වේ .

8 . ……………………….තුළින් ප්‍රකාශ වන්නේ මව් පිය උපස්ථානය මංගල කරුණක් බවයි .

9 . බුදුන්වහන්සේ ලෙඩුන්ට උවටැන් කළ බව ……………………………. කතාවේ සඳහන් වේ .

10 . එක රළු පහරකින් කඩු දහයකින් වන රිදුමටත් වඩා රිදුමක් වන බව……………………..කවියෙන් කිය වේ .

විමලරත්න කුමාරගම මහතාගේ කවිය , ටියුඩර් අමරසේකරගේ කාව්‍යයේ ,

පූතිගත්තතිස්ස තෙරුණ්ගේ කතාව , බයිබලය , එස් . මහින්ද හිමිගේ කවිය

මහා මංගල සූත්‍රය , සැලළිහිණි සන්දේශය කවිය , චුල්ල හංස ජාතකය

මහගමසේකර මහතාගේ කවිය , මාතුපෝෂක ජාතකය

# ක්‍රියාකාරකම් - 4

❖ පහත එක් එක් වාක්‍යයේ හිස්තැන් සම්පූර්ණ කිරීමට සුදුසු පදය තෝරන්න .

1 . වචන භේදයෙහි හා ලිංග භේදයෙහි ……………………………. වර නැඟේ .

i . නිපාත පද　ii . උපසර්ග පද　iii . නාම පද　iv . ක්‍රියා පද

2 .පුරුෂ භේදයේ හා කාල භේදයේ ………………………………. වර නැඟේ .

i . ක්‍රියා පද　ii . නිපාත පද　iii . නාම පද　iv . උපසර්ග පද

3 . වර නැඟිය නොහැකි පද විශේෂය ……………………… ලෙස හැඳින්වේ.

i . නාම පද　ii . උපසර්ග පද　iii . ක්‍රියා පද　iv . අව්‍ය පද

4 ……………………… පද පදයක මුලින් යෙදී පදයේ අර්ථයට විරුද්ධාර්ථයක් දෙන , අර්ථය තිව්‍ර කරන පද් විශේෂයකි .

i . උපසර්ග පද　ii . ක්‍රියා පද　iii . නාම පද　iv . නිපාත පද

5 . වාක්‍යයක අර්ථය පැහැදිලි වන සේ එහි පද සම්බන්ධ කරන්නේ…………………….. පද මඟිනි .

i . නිපාත පද　ii . උපසර්ග පද　iii . නාම පද　iv .ක්‍රියා පද

# ක්‍රියාකාරකම් - 5

- පහත 'අ' කොටසේ සඳහන් නිපාත පද අයත් වන නිපාත අර්ථය ' ආ ' කොටසෙන් තෝරන්න .

| අ | ආ |
|---|---|
| 1 . විතර , පමණ | උපමාර්ථය |
| 2 . දක්වා , සිට | ප්‍රශ්නාර්ථය |
| 3 . මෙන් , සේ | ආමන්ත්‍රණාර්ථ |
| 4 . අද , හෙට | සීමාර්ථය |
| 5 . ඇයි ද , මක් නිසා ද | සමුච්චයාර්ථය |
| 6 . වහා , සෙද | කාලාර්ථය |
| 7 . කෙරෙහි , විසින් | ප්‍රමාණාර්ථය |
| 8 . අනේ , අපොයි | විභක්ත්‍යාර්ථය |
| 9 . සහ , සමඟ | සීඝ්‍රාර්ථය |
| 10 . එම්බල , යුෂ්මතා | භාවාර්ථය |

# ක්‍රියාකාරකම් - 6

❖ එක් එක් වාක්‍යයේ ඇතුළත් නිපාත පද උපුටා දක්වන්න .

1 . උදේ පටන් වකුටු කොන්ද දිග ඇරපල්ලා . -…………………………..

2 . අනේ දෙවිදත් නොදිටි මොක්පුර - ……………………………

3 . අද අද එයි මරු පින් කර ගන්නේ -…………………………..

4 . නිති ගේ දොර ඇමද - කැළි කසළ දැක නොම ඉද - ……………………………

5 . නො සතුටුව ඉන්නා - දනන් මෙන් බලා උන්නා - ……………………………

6 . නොම්හිරි ද මේ වෙන - ……………………………

7 . තතනා විනා කෙවනා සොබනා එ උයනා - ……………………………

8 . කවදා කොතැනදෝ කෙලෙසක දෝ - ……………………………

9 . මා වැනි බිළින්දා වර වර ළඟට කැන්දා - ……………………………

10 . තැවෙන සේ සිහියක් ඇති වීම මැයි - ……………………………

# ක්‍රියාකාරකම - 7

- පහත සඳහන් ඡේද නිවැරදි ව පද බෙදා ලියන්න .

1 . දරුවෙනීඑසේනම්කැඳවන්නටත්පළමුසතුරාඅපවෙතඑන්නේය.සටනපටන්ගනිව්පෙරමුණරකිනසෙන්පතිවරුන්ඒඒ
පෙරමුණසිටපසුනොබැසසටන්කළයුතුය.මෙතැන්සිටගමනඉදිරියටවිනාපසුබැසීමක්තවත්අපටනැතිබවතරයේසිතටගතයුතු
යයිදනායකසෙනෙවිකීවේය .

2 . ත්‍රිපිටකධර්මයපිළිබඳහසලදැනුමක්ලබාසිටිධර්මපාලතුමාපුද්ගලඅභිවෘද්ධියඇතිකරගැනීමපිණිසබුදුදහමේපිටිවහලලබාගත
හැකිආකාරයසූත්‍රපාඨඋපුටාදක්වමින්සිංහලයන්ටපෙන්වාදුන්නේය.සමෘද්ධිමත්ආර්ථිකයක්ගොඩනගාගැනීමසඳහාබුද්ධ
දේශනාව නොදැනීමසිංහලයන්ගේකුසීතභාඅඥානකමටහේතුවශයෙන්එතුමාප්‍රකාශකළේය .

# ප්‍රායෝගික අභ්‍යාසය

මේප්‍රවෘත්තියේතියෙනවාඑකනිර්භීතළමයෙක්කැලයක්මැදින්යද්දිඔහුඉදිරියටකොටියෙක්ආවාලු ඉතින්තාත්තාපුවත්පතේ සඳහන්ප්‍රවෘත්තියදිගටමකියවාගෙනයයිඑමප්‍රවෘත්තියඅනුවකොටියාසමඟපොරබැදූළමයාඅන්තිමේදිපණබේරාගන්නටගහක් මුදුනටනැග්ගබවත්වරුවක්මළමයාමෙසේගසඋඩසිටිනඅතරගම්වැසියන්පැමිණගසමුලරැකසිටිකොටියාමරාළමයාබේරාගත් බවසඳහන්විය .

1 . ඉහත සඳහන් ඡේදය පද බෙදා ලියන්න .

2 . එම ඡේදයේ ඇතුළත් නිපාත පද පහක් උපුටා ලියන්න .

# පිළිතුරු

## • ක්‍රියාකාරකම් - 1

1. තිරුවල්ලුවර්
2. සද්ධර්මරත්නාවලි
3. කෝට්ටේ
4. රණස්ගල්ලේ හිමි
5. සැලළිහිණි සන්දේශය
6. නන්දිවිසාල ජාතක
7. පන්සිය පනස් ජාතක
8. සුභාෂිතය

## • ක්‍රියාකාරකම් - 2

| | |
|---|---|
| 1. √ | 2 . **X** |
| 3 . √ | 4 . √ |
| 5 . **X** | 6 . √ |
| 7 . √ | 8 . **X** |
| 9 . √ | 10 . √ |

## • ක්‍රියාකාරකම් - 3

1බයිබලය

2 මාතුපෝෂක ජාතකය

3සැලළිහිණි සන්දේශය කවිය

4 ටියුඩර් අමරසේකරගේ කාව්‍යයේ

5 චුල්ල හංස ජාතකය

6 මහගමසේකර මහතාගේ කවිය

7 විමලරත්න කුමාරගම මහතාගේ කවිය

8 මහ මංගල සූත්‍රය

9පූතිගත්තතිස්ස තෙරුණ්ගේ කතාව

10එස් . මහින්ද හිමිගේ කවිය

## ක්‍රියාකාරකම් - 4

1 . නාම පද

2 . ක්‍රියා පද

3 . අව්‍ය පද

4 . උපසර්ග පද

5 . නිපාත පද

## ක්‍රියාකාරකම් - 5

1 . ප්‍රමාණාර්ථය

2 . සීමාර්ථය

3 . උපමාර්ථය

4 . කාලාර්ථය

5 . ප්‍රශ්නාර්ථය

6 . ශීඝ්‍රාර්ථය

7 . විභක්ත්‍යාර්ථය

8 . භාවාර්ථය

9 . සමුච්චයාර්ථය

10 . ආමන්ත්‍රණාර්ථ

## ❖ ක්‍රියාකාරකම් - 6

1 . පටන්

2 . අනේ

3. අද අද

4 . නිති , නො

5 . නො , මෙන්

6 . නො , ද

7 . විනා

8 .කවදා , කොතැනදෝ , කෙලෙසක දෝ

9 .වැනි

10 . සේ

## ක්‍රියාකාරකම් - 6

1 . දරුවෙනි , එසේ නම් කැඳවන්නටත් පළමු සතුරා අප වෙත එන්නේ ය . සටන පටන් ගනිව් පෙරමුණ රකින සෙන්පතිවරුන් ඒ ඒ පෙරමුණ සිට පසු නොබැස සටන් කළ යුතු ය . මෙතැන් සිට ගමන ඉදිරියට විනා පසු බැසීමක් තවත් අපට නැති බව තරයේ සිතට ගත යුතු යයි ද නායක සෙනෙවි කීවේ ය

2 . ත්‍රිපිටක ධර්මය පිළිබඳ හසල දැනුමක් ලබා සිටි ධර්මපාලතුමා පුද්ගල අභිවෘද්ධිය ඇතිකර ගැනීම පිණිස බුදු දහමේ පිටිවහල ලබා ගත හැකි ආකාරය සූත්‍ර පාඨ උපුටා දක්වමින් සිංහලයන්ට පෙන්වා දුන්නේ ය. සමෘද්ධිමත් ආර්ථිකයක් ගොඩ නගා ගැනීම සඳහා බුද්ධ දේශනාව නොදැනීම සිංහලයන්ගේ කුසීත හා අඥානකමට හේතු වශයෙන් එතුමා ප්‍රකාශ කළේය .